# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## අනධ්‍යයන තනතුරු ඇබෑර්තු - 2025

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් අනධ්‍යයන තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2026.01.02 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. විගණන සහකාර II ශ්‍රේණිය

- **සුදුසුකම් :**

**1.** අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

I. සිංහල භාෂාව/දෙමළ භාෂාව
II. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
III. ගණිතය

සහ

**2.** අ.පො.ස. (උසස් පෙළ) නව විෂය නිර්දේශය යටතේ සියලුම විෂයයන් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (අ.පො.ස. (උසස් පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත් වීම)

සහ

**3. තනතුරට විශේෂ වූ සුදුසුකම්**

(අ). ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ මූලික (Preliminary) අදියර / ආවාසරික (Licentiate) I අදියර/ පදනම් (Foundation) අදියර / CAB I / විධායක අදියර (Executive) සමත් වීම හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් ලබා තිබීම

හෝ

(ආ). වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පදනම් අදියර සමත් වීම (CIMA)

හෝ

(ඇ). ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත් වීම. (HNDA)

හෝ

(ඇ). ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සාමාජිකත්වය ලබා තිබීම

සහ

**4.** විගණන කටයුතු පිළිබඳ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් ලබා තිබීම.

මාස හයකට නොඅඩු පරිගණක යෙදවුම් (Computer Applications) පිළිබඳ පිළිගත හැකි සුදුසුකම් පිළිගත් ආයතනයකින් ලබා ගත් අය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

- **තේරීම** : සම්මුඛ පරීක්ෂණයකින්.
- **වැටුප් ක්‍රමය හා වැටුප් පරිමාණය**: U-MN 2(II) - රු. 61,275-18x890-77,295 (මාසික)
  (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)
- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2022

## 02. කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය

- **සුදුසුකම් :**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.
   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
   iii. ගණිතය

සහ

2. අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරක දී විෂයයන් තුන ම (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබිය යුතු ය.

**පහත සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.**

අ). පිළිගත් ආයතනයකින් පරිගණක යෙදවුම් සම්බන්ධයෙන් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක් සඳහා ලබා ගන්නා ලද පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

සහ

ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම.

<u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u>

ඉහතින් දක්වා ඇති සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) තනතුරට විශේෂ වූ පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

- ගබඩා පරිපාලනය පිළිබඳ වසරක පළපුරුද්ද සහ/හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වාණිජ්‍ය විෂය සමත්ව තිබීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගණකාධිකරණය විෂය සමත්ව තිබීම.

- **තේරීම** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්
- **වැටුප් ක්‍රමය හා වැටුප් පරිමාණය :** UMN 1(III), - රු. 49,475-17×540 – 58,655 (මාසික)
  (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**සටහන :**

a. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
b. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.
c. මනා චරිතයක් තිබිය යුතු ය.

- තෝරා ගනු ලබන අය විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් තැබිය යුතු ය.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 12/2018

## 03. විද්‍යාගාර සහායක III ශ්‍රේණිය (පරිගණක ඒකකය)

- **සුදුසුකම් :**

1. (අ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   හෝ

   (ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කාර්මික කුසලතා සහිත සේවා පළපුරුද්දක් ලබා තිබීම.

- **වැටුප් ක්‍රමය හා වැටුප් පරිමාණය**: U-PL 2(III) - රු. 44,575 – 16×490 – 52,415 (මාසික)
  (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)
- **තේරීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.
- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

**සටහන:** සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා යහපත් ශාරීරික හා මානසික මට්ටමකින් යුක්ත විය යුතුය.
iii. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 14/2024

<u>ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ</u>

- තනතුරට පත් කිරීමෙන් පසු අදාළ තනතුරට හිමි මාසික වැටුපෙන් සේවා දායකයාගෙන් 10% හා සේවා යෝජකයා විසින් 15% මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථ සාධක අරමුදලට දායක කරනු ඇත. තවද සේවා යෝජකයා විසින් මාසික වැටුපෙන් 3% මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ඇත.

- පාරිතෝෂික දීමනාව

<u>අනෙකුත් ප්‍රතිලාභ</u>

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාර ව හිමි අනෙකුත් දීමනා
- විශ්වවිද්‍යාලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට දායක කරගනු ඇත.

**<u>අයදුම් කළ යුතු ආකාරය:</u>**

අයදුම්කරුවන්ට තනතුරට අදාළ සුදුසුකම් දක්වා ඇති තොරතුරු පත්‍රිකා සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.bpu.ac.lk) බාගත (download) කළ හැකි ය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතිකවල සහතික කළ ඡායා පිටපත් ද සහිත ව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම් කරනු ලබන තනතුර පැහැදිලි ව සඳහන් කර 2026.01.02 දින හෝ ඊට පෙර, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 37, මොරගහහේන පාර, පිට්පන නගරය, හෝමාගම. යන ලිපිනය වෙත **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතු ය. ලියාපදිංචි තැපැල් කුවිත්තාන්සියේ පිටපතක් ලිපි කවරයේ අමුණා එවිය යුතු ය.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවා නියුක්තිකයන් විසින් එවනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවීමට කටයුතු කළ යුතු ය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපැහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 37, මොරගහහේන පාර,**
**පිට්පන නගරය,**
**හෝමාගම.**
**2025.12.14**